


ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.

# ඉතිහාසය

**සැලකිය යුතුයි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

කාලය පැය 01 යි.

- පහත තොරතුරු පදනම් කරගනිමින් 1 හා 2 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ථූපවංශය    B - පූජාවලිය    C - කවිසිළුමිණ
D - උත්තර විහාරට්ඨ කථා    E - විශුද්ධි මාර්ගය    F - වංසත්ථප්පකාසිනී

(01) දීපවංශය හා මහාවංශය රචනා වීමට පෙර ලියැවුණු සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
(1) A ය. (2) D ය. (3) E ය. (4) F ය.

(02) කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් රචනා කළ කෘතිය කුමක්ද?
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

(03) මෙරට ගල් යුගයට අයත් මානවයා වාසය කළ පරිසර කලාප අතරින් රාවනා ඇල්ල ප්‍රදේශය අයත් වන්නේ,
(1) පහත රට අතරමැදි කලාපයට ය. (2) කඳුකර වියළි අතරමැදි කලාපයට ය.
(3) තෙත් කලාපයට ය. (4) අර්ධ ශුෂ්ක කලාපයට ය.

(04) ප්‍රාග් ඓතිහාසික අභිචාර විධි පිළිබඳව විමසීමේ දී මියගිය පසුව නමා වකුටුකොට භූමිදානය කළ මානවයින්ගේ ඇටසැකිලි හමුව ඇත්තේ පහත කුමන ස්ථානයෙන් ද?
(1) කුරුවිට බටදොඹ ලෙන (2) කිතුල්ගල බෙලිලෙන
(3) අත්තනගොඩ අළුලෙන (4) පාහියන්ගල ලෙන

(05) පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාස වියළි කලාපය කේන්ද්‍ර කරගනිමින් නිර්මාණය වීමට බලපෑ ප්‍රධාන භෞතික සාධකය පහත ඒවායින් කුමක් ද?
(1) වර්ෂා පතනය (2) මෘදු හෝ රැළි භූ විෂමතා
(3) කඳුකර ප්‍රදේශ (4) රතු, දුඹුරු පස්

(06) A - තම ප්‍රතිමල්ලවයාට පවා ගෞරව කර සහජීවන ගුණය පෙන්වීම.
B - ජාතියෙන් බුදු සසුනේත් චිරස්ථිතිය පිණිස යුධ වැදීම
C - රෝහල් 18ක් කරවීම.
ඉහත තොරතුරු හා අදාළ මෙරට පහළ වූ විශිෂ්ඨ පාලකයා පහත පිළිතුරුවලින් තෝරන්න.
(1) I විජයබාහු රජු (2) දුටුගැමුණු රජු
(3) පණ්ඩුකාභය රජු (4) I පරාක්‍රමබාහු රජු

(07) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසුව ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මේ "පන අදෙක" යනුවෙන් හඳුන්වන ලද්දේ,
(1) රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි (2) නාගරික වාස්තු විද්‍යාඥ
(3) නගර පරිපාලක (4) වෙළඳ කටයුතු භාර ප්‍රධානි

(08) මැදිරිගිරිය ඇත්වෙහෙර පධානඝරයකට ඉඩම් පූජා කිරීම හා අදාළ නීතිමය කටයුතු සිදුකිරීමට මහ ලේකම් කාශ්‍යප පැමිණි බව එහි සෙල්ලිපියක සඳහන්ය. එම ඉඩම් පූජා කළ රජු කවුරුන් ද?
(1) III උදය රජු (2) II සේන රජු
(3) IV කාශ්‍යප රජු (4) I උපතිස්ස රජු

- 9 හා 10 ප්‍රශ්න සඳහා පහත වගුව භාවිත කර නිවැරදි පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - දථික සුමන | D - මණ්ඩගල සෙල්ලිපිය | G - ඇත් දළ කැටයම් |
| B - ලපන තිස්ස | E - වෙගිරිය දේවාල සෙල්ලිපිය | H - චිත්‍ර ශිල්පය |
| C - වාපර සුමන | F - නැවටු කන්ද සෙල්ලිපිය | I - සංඝයාට ගල් ගුහාවක් පිදීම. |

(09) පැරණි ඇත්දළ කැටයම්කරුවකු සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,
(1) AFI (2) ADH (3) AEG (4) AEI

(10) භික්ෂූන් වහන්සේට ගල් ගුහාවක් පිදීම හා සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) CDI (2) BEI (3) AFI (4) CEI

(11) අපේ මුතුන්මිත්තන්ගේ පැරණි විද්‍යාව හා තාක්ෂණය මැනවින් අවබෝධ කරගත හැකි "පීඩන ශල්කනය" මූලධර්මය ප්‍රයෝජනයට ගත් අවස්ථාව පහත පිළිතුරුවලින් තෝරන්න.
(1) මැටි ඔරු සුසාන (2) මහා ශිලා සුසාන
(3) බිම් වීදුරු ගල් මෙවලම් (4) මාදුරු ඔය සොරොව්ව

(12) පහත I හා II තීරු නිවැරදිව ගළපා අදාළ පිළිතුර තෝරන්න.

| I | | II |
|---|---|---|
| ඇළහැර අමුණ | A | කඳුවැටි නොමැතිව වාපකාරව ශක්තිමත් ලෙස ඉදිකරවීම. |
| මිණිපේ අමුණ | B | යාන් ඔයේ ජලයෙන් පෝෂණය ලබාදීම |
| හුරුළු වැව | C | අඹන්ගඟ හරස්කර කන්තලේ වැව දක්වා ඇල මාර්ගයකින් ජලය ගෙනයාම. |
| යෝධ වැව | D | ශක්තිමත් කළුගල් තලාවක දී ගඟ හරස්කර ඇල මාර්ගය ඔස්සේ පොළොන්නරුවට දියවර සැපයීම. |

(1) DCBA (2) CDBA (3) BDCA (4) ACBD

(13) අපේ පැරණි මුතුන්මිත්තන් ගවයින්ගේ රැකවරණය සඳහා සිදුකළ කිරිමඩු යාගයේ දී මුල් කරගන්නා ස්වදේශීය දෙවියන් වනුයේ,
(1) විභීෂණය (2) සමන්ය. (3) මංගරය (4) අයියනායකය

(14) "මහවිනිවහි ලබනක වටිති" යනුවෙන් සඳහන් කර සිතුල්පව්ව විහාරයේ සෙල්ලිපියක් කරවා විනිශ්වය ශාලාවක බදු ආදායම භික්ෂූන් වහන්සේ ගේ සිව් පසය සඳහා පිරිනැමූ රජු,
(1) I ගජබාහුය. (2) දුටුගැමුණු රජුය.
(3) III උදය රජුය. (4) කුටකණ්ණ අභය රජුය.

(15) රසවාහිනීය නම් සාහිත්‍ය මූලාශ්‍රයට අනුව "කුමන යස ඉසුරු පැවතියත් දූවරු හා පුතුන් නොමැති ජීවිතය කුමන සැපයක් දැයි" භික්ෂූන් වහන්සේගෙන් විමසූ කාන්තාව කවුද?
(1) සුගලා දේවිය (2) ලීලාවතී බිසව (3) අනුලා බිසව (4) විහාරමහා දේවිය

(16) A යාපහුව රාජධානිය ඇරඹීම.
B කුරුණෑගල රාජ්‍යය ආරම්භ කිරීම.
C රිදී විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.
D වන්නි නායකයන්ගේ කැරලි මර්ධනය කිරීම.
E චීනයට 20 වතාවත් දූතයන් යැවීම.
F ඊජිප්තුව සමඟ වෙළඳ කටයුතු සඳහා තානාපතිවරු යැවීම.
ඉහත සිදුවීම් අතරින් I බුවනෙකබාහු රජු ආශ්‍රිත තොරතුරු දක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ACE (2) ADF (3) BDF (4) CEF

(17) පහත I හා II තීරු ගළපා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| දඹදෙනිය | E සද්ධර්මාලංකාරය |
| කුරුණෑගල | F ථූපවංශය |
| ගම්පොල | G දළදා සිරිත |
| කෝට්ටේ | H බුදුගුණ අලංකාරය |

(1) FGEH (2) HGEF (3) FGHE (4) GFS

(18)
- නවරාජ පෙළපතක ආරම්භකයා වීම.
- බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම.
- මහනුවර පළමු දළදා මැදුර කරවීම.

ඉහත තොරතුරු ආශ්‍රිත උඩරට පාලකයා වන්නේ,
(1) I විමලධර්ම සුරියරජු (2) II විමලධර්මසූරිය රජු
(3) II රාජසිංහ රජු (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(19) ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පාලනය කිරීම හා සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
(1) සැමවිටම උඩරට සමඟ සාමකාමීව කටයුතු කිරීම.
(2) උඩරටට එරෙහිව සැමවිටම දැඩි වූ ප්‍රතිපත්තියක සිටීම.
(3) පහතරට හා උඩරට ආර්ථිකය මුළුමනින්ම වෙනස් කිරීම.
(4) මුහුදුබඩ පරිපාලනය මුළුමනින්ම වෙනස් කිරීම.

(20) පහත ABCD යටතේ දක්වා ඇති සිදුවීම් අනුපිළිවෙල අනුව පෙළගැස්වූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
A ශ්‍රී විජය රාජසිංහ රජු මහනුවර රජවීම.
B ටිකිරි බණ්ඩාර කුමරු මුල්ලේරියා සටන ජය ගැනීම.
C දොන් ජුවන් ධර්මපාල කෝට්ටේ රජවීම.
D යාපනය පෘතුගීසි පාලනයට සතුවීම.
(1) BCDA (2) CBDA (3) DCBA (4) ACDB

(21) ක්‍රි.ව. 1848 සිංහලේ දෙවන නිදහස් සටන හා සම්බන්ධ වූ නායකයා දක්වෙන පිළිතුර කුමක් ද?
(1) කැප්පෙටිපොල දිසාවේ. (2) ගලගෙදර මොහොට්ටාල
(3) හඟුරන්කෙත් ඩිංගිරාල (4) බූටැවේ රටේරාල

(22) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට තුළ තම ආගම පැතිරවීමට මිෂනාරී සංවිධානවල සහය මුලින් ම ලබාගත් ආණ්ඩුකාරයා කවරෙක් ද?
(1) ෆෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මේට්ලන්ඩ්
(3) රොබට්බ්‍රවුන්රිග් (4) ටොරින්ටන්

(23) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ දී කොටහේන දීපදුත්ත විහාරයේ වැඩ වසමින් බුදුසමයට දැවැන්ත සේවාවක් ඉටුකළ භික්ෂූන් වහන්සේ,
(1) හික්කඩුවේ සුමංගල හිමි (2) රත්මලානේ ධර්මාලෝක හිමි
(3) වලානේ සිද්ධාර්ථ හිමි (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(24) ශ්‍රී ලංකාවේ සිදුවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ආශ්‍රිත තොරතුරු මඟින් I හා II තීරු ගළපා වැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | | II තීරුව |
|---|---|---|
| ක්‍රි.ව. 1910 කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය | A | රාජ්‍ය මන්ත්‍රණ සභාව |
| ක්‍රි.ව. 1920 මැනිං මැකලම් ආණ්ඩුක්‍රමය | B | ව්‍යවස්ථාදායක නිල නොලත් බහුතරය |
| ක්‍රි.ව. 1924 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය | C | පළාත් බල නියෝජනය හඳුන්වාදීම. |
| ක්‍රි.ව. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය | D | ඡන්ද බලය හඳුන්වාදීම. |

(1) CDBA (2) DCBA (3) BACD (4) DCAB




**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.**

# ඉතිහාසය

(19) ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පාලනය කිරීම හා සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
- (1) සැමවිටම උඩරට සමග සාමකාමීව කටයුතු කිරීම.
- (2) උඩරටට එරෙහිව සැමවිටම දැඩි වූ ප්‍රතිපත්තියක සිටීම.
- (3) පහතරට හා උඩරට ආර්ථිකය මුළුමනින්ම වෙනස් කිරීම.
- (4) මුහුදුබඩ පරිපාලනය මුළුමනින්ම වෙනස් කිරීම.

(20) පහත ABCD යටතේ දක්වා ඇති සිදුවීම් අනුපිළිවෙල අනුව පෙළගැස්වූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
- A ශ්‍රී විජය රාජසිංහ රජු මහනුවර රජවීම.
- B ටිකිරි බණ්ඩාර කුමරු මුල්ලේරියා සටන ජය ගැනීම.
- C දොන් ජුවන් ධර්මපාල කෝට්ටේ රජවීම.
- D යාපනය පෘතුගීසි පාලනයට සතුවීම.

(1) BCDA (2) CBDA (3) DCBA (4) ACDB

(21) ක්‍රි.ව. 1848 සිංහලේ දෙවන නිදහස් සටන හා සම්බන්ධ වූ නායකයා දක්වෙන පිළිතුර කුමක් ද?
- (1) කැප්පෙටිපොල දිසාවේ.
- (2) ගලගෙදර මොහොට්ටාල
- (3) හඟුරන්කෙත් ඩිංගිරාල
- (4) බුටැවේ රටේරාල

(22) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට තුළ තම ආගම පැතිරවීමට මිෂනාරි සංවිධානවල සහය මුලින් ම
ලබාගත් ආණ්ඩුකාරයා කවරෙක් ද?
- (1) ෆෙඩ්රික් නෝර්ත්
- (2) තෝමස් මේට්ලන්ඩ්
- (3) රොබට්බවුන්රිග්
- (4) ටොරින්ටන්

(23) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ දී කොටහේන දීපදූත්ත විහාරයේ වැඩ වසමින් බුදුසමයට දැවැන්ත සේවාවක් ඉටුකළ භික්ෂූන් වහන්සේ,
- (1) හික්කඩුවේ සුමංගල හිමි
- (2) රත්මලානේ ධර්මාලෝක හිමි
- (3) වලානේ සිද්ධාර්ථ හිමි
- (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(24) ශ්‍රී ලංකාවේ සිදුවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ආශ්‍රිත තොරතුරු මඟින් I හා II තීරු ගළපා වැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | | II තීරුව |
|---|---|---|
| ක්‍රි.ව. 1910 කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය | A | රාජ්‍ය මන්ත්‍රණ සභාව |
| ක්‍රි.ව. 1920 මැනිං මැකලම් ආණ්ඩුක්‍රමය | B | ව්‍යවස්ථාදායක නිල නොලත් බහුතරය |
| ක්‍රි.ව. 1924 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය | C | පළාත් බල නියෝජනය හඳුන්වාදීම. |
| ක්‍රි.ව. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය | D | ඡන්ද බලය හඳුන්වාදීම. |

(1) CDBA (2) DCBA (3) BACD (4) DCAB

(25) නිදහස ලබා ගැනීමේ අරමුණින් මෙරට වාමාංශිකයන් ක්‍රි.ව. 1935 දී පිහිටුවාගත් දේශපාල පක්ෂය කුමක් ද?
- (1) සමසමාජ පක්ෂය
- (2) කොමියුනිස්ට් පක්ෂය
- (3) එ.ජා.ප
- (4) ශ්‍රී.ල.නි.ප

(26) A හෙමලියා වෙස්ටර්ට්‍රික්ස් රෝගය පැතිරයාම.
B අගලවත්ත පර්යේෂණ ආයතනයක් පිහිටුවීම.
C ක්විනීන් නැමති ඖෂධය නිපදවීමට යොදා ගැනීම.
D ජේම්ස් ටේලර් ලුලුකඳුර වතුයාගේ පර්යේෂණ වගා සිදු කිරීම.
ඉහත තොරතුරු ආශ්‍රිත වගාවන් මොනවාදැයි නිවැරදිව අනුපිළිවෙලට අනුව තෝන්න.
- (1) කෝපි, රබර්, සිංකෝනා, තේ
- (2) කෝපි, පොල්, සිංකෝනා
- (3) කුරුඳු, පොල්, රබර්, තේ
- (4) කෝපි, තේ, රබර්, සිංකෝනා, රබර්

(27) බ්‍රිතාන්‍යයන්ගේ පාලනය නිසා උරුම වූ ප්‍රයෝජනවත් අංගයක් නොවන සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
- (1) ගමනාගමනය දියුණු වීම.
- (2) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
- (3) අපනයන වැවිලි බෝග හඳුන්වාදීම.
- (4) ගම්සභා ක්‍රමයේ වර්ධනය

(28) ක්‍රි.ව. 1947 දී හඳුන්වාදුන් සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අනුව අග්‍රාණ්ඩුකාරවරයා පත්කරනු
ලබන්නේ,
- (1) පාර්ලිමේන්තුව මඟිනි.
- (2) බ්‍රිතාන්‍ය රැජින විසිනි.
- (3) අගමැති විසිනි.
- (4) මහමැතිවරණයෙන් පසුව කැබිනට් මණ්ඩලය මඟිනි.

(29) ජනතා පරමාධිපත්‍යය යන අදහස ගැබ්ව ඇති වඩාත් නිවැරදි ප්‍රකාශය පහත ඒවායින් කුමක් ද?
- (1) තමන් කැමති දේශපාලන පක්ෂයකට බැඳී කටයුතු කිරීම.
- (2) පාලන පක්ෂයේ කටයුතු ප්‍රසිද්ධියේ විවේචනය කිරීම.
- (3) ඡන්ද බලයෙන් අභිමත පාලකයෙකු පත්කිරීමට හෝ ඉවත් කිරීමට ඇති අයිතිය.
- (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සලසා ඇති මූලික මිනිස් අයිතිවාසිකම් භුක්තිවිඳීමේ අයිතිය.

(30) A - පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බහුතරයකගේ කැමැත්ත දිනාගත හැකියැයි ජනාධිපති කල්පනා කරන
අය අගමැති ලෙස පත්කිරීම.
B - මහමජන නියෝජිතයින් බහුතරයකගේ කැමැත්ත ඇති අය අගමැති තනතුරට පත්වීම.
C - අගමැතිගේ උපදෙස් අනුව ජනාධිපති කැබිනට් ඇමතිවරු පත්කිරීම.
D - අග විනිසුරු හා ඉහළ උසාවිවල විනිසුරුවන් ජනාධිපති විසින් පත්කිරීම.
ඉහත තොරතුරු අනුව ක්‍රි.ව. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව හා අදාළ කරුණු 02 කුමක් ද?
- (1) A, C සත්‍ය වන අතර BD අසත්‍ය වේ.
- (2) B, C සත්‍ය වන අතර AD අසත්‍ය වේ.
- (3) C, D සත්‍ය වන අතර AB අසත්‍ය වේ.
- (4) A, D සත්‍ය වන අතර BC අසත්‍ය වේ.

(31) නිදහසින් පසුව ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමට ආරම්භ කළ විශාලතම ව්‍යාපෘතිය මහවැලියයි. ඒ යටතේ ඉදිකර අවසන් කරන ලද අවසන් ජලාශය වන්නේ,
- (1) ඉහළ කොත්මලේයි.
- (2) මොරගහ කන්දයි.
- (3) කුකුලේ ගඟයි.
- (4) රඹකැන් ඔයයි.

(32)

| I | | II |
|---|---|---|
| ලියනාඩෝ ඩාවින්චි | P | ලෝරාට සැහැලි කවි |
| මයිකල් ඇන්ජලෝ | Q | අවසාන විනිශ්චය |
| පෙට්රාක් | R | ඩිවිනා කොම්ඩිවා |
| අලගියරි ඩාන්ටෙ | S | අන්තිම භෝජන සංග්‍රහය |

(1) SQPR (2) SPQR (3) QPSR (4) PRQS

(33) මතු දැක්වෙන සිද්ධීන්වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙල දැක්වෙන්නේ කිනම් පිළිතුරේ ද?
- A මානව හිමිකම් දිනාගැනීමේ ප්‍රංශ විප්ලවය.
- B පෘතුගීසීන් ශ්‍රී ලංකාවට ගොඩබැසීම.
- C පළමුවන ලෝක යුද්ධය
- D කොන්ස්තන්ති නෝපල් නගරය තුර්කීන්ට යටත් වීම.
- E ගැලීලියෝ ගැලිලි දුර දක්නට නිපදවීම.

(1) DBEAC (2) DEBAC (3) DBACE (4) DEABC

(34) මධ්‍යගත යුගයේ දී වැදගත් වූ නගර කිහිපයක් යාබද සිතියමේ ලකුණු කර ඇත. ඒවා ABCD යන අනුපිළිවෙලින් නම් කළ විට නිවැරදි පිළිතුර කුමක් ද?
- (1) වෙනීසිය, ඇලෙක්සැන්ඩ්‍රියාව, ෆ්ලෝරන්ස්, ජිනෝවා
- (2) කොන්ස්තන්තිනෝපල්, වෙනීසිය, ජිනෝවා, ඒඩන්
- (3) ඇලෙක්සැන්ඩ්‍රියා, වෙනීසිය, ජිනෝවා, කොන්ස්තන්තිනෝපල්
- (4) ඒඩන්, වෙනීසිය, ජිනෝවා, ඇලෙක්සැන්ඩ්‍රිය.

(35) ඇමරිකානු විප්ලවය සම්බන්ධ පිලඩෙල්පියා සම්මේලන දෙකෙහි දී ගත් තීරණ අතරින් සාවද්‍ය ප්‍රකාශය පහත ඒවායින් කුමක් ද?
- (1) නීති පැනවීමට හෝ බදු පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට අයිතියක් නොමැති බව.
- (2) ජනපදවාසීන් සන්නද්ධ විය යුතු බව
- (3) මහද්වීපික හමුදාවක් ලෙස සංවිධානය විය යුතු බව
- (4) අසල්වැසි බ්‍රිතාන්‍ය යටත් විජිතවලට පහර දිය යුතුය.

(36) පහත තොරතුරුවලින් කාර්මික විප්ලවය අදාළ බව ප්‍රබල සමාජ පෙරලිය හා සම්බන්ධ සිදුවීම කුමක් ද?
- (1) බහු ජාතික සමාගම් බිහිවීම.
- (2) මුඩුක්කු නිවාස ආරම්භ වීම.
- (3) පරිසර දූෂණය ඇරඹීම.
- (4) නව සමාජ පන්ති බිහිවීම.

(37) ප්‍රංශ විප්ලවය සමාරම්භය සනිටුහන් කළ සිදුවීම පහත ඒවායින් කවරක් ද?
- (1) බැස්ටීලයට පහරදීම.
- (2) 16 ලුවී රජුට මරණ දඬුවම පැමිණවීම.
- (4) ටෙනිස් පිටියේ දිවුරුම.
- (4) ස්ටේට් ජෙනරල් සභාව රැස්කිරීම.

(38) පළමු ලෝක සංග්‍රාමයෙන් පසුව බිහිවූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ ප්‍රධානතම හේතුව
වන්නේ,
- (1) රුසියාවට සාමාජිකත්වය නොදීම.
- (2) සාමාජික රටවල් අතර සමගිය බිඳියාම.
- (3) එක්සත් ජනපදය සාමාජිකත්වය නොගැනීම.
- (4) යුද්ධ මැඩලීමට හමුදා බලයක් නොතිබීම.

(39) පහත (අ) තීරුව හා (ආ) තීරුව නිවැරදිව ගැලපූ විට නිවැරද පිළිතුර කුමක් ද?

| (අ) | | (ආ) |
|---|---|---|
| ඇඩොල්ෆ් හිට්ලර් | I | පැරිසිය නිදහස්කර ගැනීම. |
| බෙනිටෝ මුසොලිනී | J | උතුරු මුහුදේ ආරක්ෂාව සඳහා නාවුක හමුදාව මෙහෙයවීම. |
| වින්ස්ටන් චර්චිල් | K | ඩැනිසිග් වරායට පහරදීම. |
| ජෝශප් ස්ටාලින් | L | ඇබිසීනියාව අල්ලා ගැනීම. |

(1) JLIK (2) KLJE (3) KJLE (4) LKJE

(40) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය නොලැබූ රට පහත ඒවායින් කුමක් ද?
- (1) ප්‍රංශය
- (2) ජපානය
- (3) චීනය
- (4) රුසියාව